කොවිඩ්-19 පිළිබඳ වාර්තාකරණයේදී මාධ්‍ය මඟින් කොවිඩ්-19 ආසාදිතයන් සහ නිරෝධායනයට ලක් කරන්නන් සමාජයේ කොන් කිරීමකට සහ ගර්හාවට ලක් වන ආකාරයෙන් පුවත් ඉදිරිපත් කිරීම, ආචාරධාර්මික උල්ලංඝනයක් සහ මේ මොහොතේ මාධ්‍ය අත රැඳි සමාජ වගකීම උල්ලංඝනය කිරීමක් බව අප විසින් දිගින් දිගටම පෙන්වා දී ඇත.

"බ්‍රැන්ඩික්ස් සේවිකාව නිසා දික්ඔය-හොන්සි වතුයාය අනාථයි" යනුවෙන් දැක්වෙන උපසිරස්තලයක් සමග ඉදිරිපත්වූ අරුණ පුවත් වාර්තාව මෙම ඊට එක් නිදසුනකි. එසේම "කොරෝනා දත් විළිස්සයි" යන සිරස්තලයෙන් යුතුව ඉදිරිපත් වූ අරුණ පුවත් වාර්තාව තවත් නිදසුනකි. මෙහිදී උල්ලංඝනය වී ඇති, කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණය සඳහා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් හඳුන්වා දුන් මාධ්‍ය ආචාර ධර්ම දෙකක් පහතින් දක්වමු.

1) [කොවිඩ්-19] වෛරසය ආසාදිත පුද්ගලයින් "රෝගීන්" මිස අනෙක් අයට "රෝගය පතුරුවන පුද්ගලයින්" ලෙස හැඳින්වීමෙන් වළකින්න"

2) මෙම කොවිඩ්-19 තත්වය ජනමනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇති වන ලෙසින් නොව, අනාගතය සම්බන්ධයෙන් ධනාත්මක බලාපොරොත්තු සහ එකිනෙකා අතර සහයෝගය ඇති වන ලෙස ප්‍රවෘත්ති සහ දැනුවත් කිරීම් ලබාදෙන්න.

මේ අතර කොවිඩ්-19 වාර්තාකරණයේදී මාධ්‍ය මගින් වගකීම් සහගත සහ ආචාර ධාර්මික මාධ්‍ය හැසිරීමක් පවත්වා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් ඔක්තෝබර් 12 අරුණ පුවත්පතේ කතුවැකිය තුළ අවධාරණය කෙරී ඇති බවද දක්වා සිටිමු.

කරුණු එසේ නම්, නැවත නැවතත් මාධ්‍ය මගින් ආසාදිතයින් 'රෝගය පතුරුවන්නන්' ලෙසින් චිත්‍රණය කරන්නේත්, ඒ ඔස්සේ ඔවුන්ව සමාජ ගර්හාවට හා කොන් කිරීමට බඳුන් කරන්නේත් මන්ද? එය කොවිඩ්-19 මර්දනයටද බාධාවක් නොවන්නේද? එසේම මෙවැනි වාර්තාකරණයක් මගින් ඇති කෙරෙන්නේම ආතතියක් සහ ඉච්ඡා භංගත්වයක් නොවේද? මේ ආචාර ධාර්මික මාධ්‍යකරණයද?

අරුණ කතුවැකියට ප්‍රවේශය
:- [http://epaper.aruna.lk/Home/ShareArticle?OrgId=9e1c0e01...](http://epaper.aruna.lk/Home/ShareArticle?OrgId=9e1c0e01...)

[http://epaper.aruna.lk/Home/ShareArticle?OrgId=2cf02627...](http://epaper.aruna.lk/Home/ShareArticle?OrgId=2cf02627...)

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ නිර්දේශයන්ට ප්‍රවේශය
:- [https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...](https://mcusercontent.com/.../6a771830-d3bd-456e-8fbf...)

**#MediaEthicsSL #lka #SinhalaPress #Aruna**